" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / பொதுவான தொலைபேசி / General Telephone: 011 - 2093000

| මගේ අංකය / எனது இலக்கம் / My No | CSWP/PLN/19/FI/01 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2020.10.07 |
|---|---|---|---|---|---|

සැලසුම් චක්‍රලේඛ අංක -2020/01

ආණ්ඩුකාර ලේකම් (බ.ප) ,
සභා ලේකම් (බ.ප),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප),
(පළාත් පාලන/කෘෂිකර්ම/සෞඛ්‍ය/මාර්ග/අධ්‍යාපන)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප)
(පාලන/පිරිස් හා පුහුණු/සැලසුම්/මූල්‍ය/ඉංජිනේරු)

**<u>2020.06.01 දින සිට ප්‍රාග්ධන වියදම් යටතේ බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීමේ හා සංශෝධනය කිරීමේ බලතල පැවරීම හා 2020.10.07 දින සිට අනෙකුත් විධිවිධාන ක්‍රියාත්මක කිරීම</u>**

රජයේ සංවර්ධන උපාය මාර්ග තුළින් ජාතික හා ජාත්‍යන්තර අභියෝගවලට සාර්ථකව මුහුණදීමට හා අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට පළාත් සභාවලින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කාර්යයන් පිළිබඳ වැඩි අවධානයක් මේවන විට යොමු වී ඇත.

02. එහිදී පවතින සීමිත මූල්‍ය සම්පත්වලින් යොදවනු ලබන සෑම ඒකකයක්ම පිරිමැසුම්දායීව , ඵලදායීව හා කාර්යක්ෂමව වැයකිරීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව ඇත. එසේම වැඩසටහන් සැලසුම් කිරීමට අදාළව ව්‍යාපෘති අනුමත කිරීමේදී පවතින මූල්‍යමය හැකියාව සහ ජනතාවගේ පාර්ශවයෙන් නම්‍යශීලීව අවශ්‍යතා ඉටුකිරීමේ හැකියාව පිළිබඳව ද සැළකිලිමත් විය යුතු වේ. ඒ සඳහා පළාතේ පවතින අසීමිත සංවර්ධන අවශ්‍යතා අතුරින් අත්‍යවශ්‍යයෙන්ම ඉටුකළ යුතු ව්‍යාපෘති ප්‍රමුඛතාගතකොට ශක්‍යතාවයකින් යුතු ව්‍යාපෘති සඳහා පමණක් මූලිකත්වය ලබාදීම වැදගත් වේ. එමෙන්ම ව්‍යාපෘතිය අනුමත කිරීමෙන් පසුව එහි ක්‍රියාකාරීත්වය පිළිබඳවද පූර්ණ අවධානයක් යොමුකළ යුතුය. තවද, රජයේ ප්‍රතිපත්ති සහ තිරසර සංවර්ධන අභිමතාර්ථ කෙරෙහි අනුගතවීම කාලීන අවශ්‍යතාවයකි. උක්ත අරමුණු ඉටුකර ගැනීම සඳහා පළාතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන ආකාරය පහත අයුරින් සංශෝධනය වන බව දන්වා සිටිමි.

ඒ අනුව,

I. 2020/06/01 දින සිට සියලුම මූල්‍ය මූලාශ්‍ර ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන සැලැස්මේ ව්‍යාපෘති අනුමත කිරීමේ හා සංශෝධනය කිරීමේ බලතල ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත පැවරේ.

II. අමාත්‍යාංශ මගින් හෝ වෙනත් පාර්ශවයන් මගින් ඉදිරිපත් කරනු ලබන මුළු ඇස්තමේන්තුව ලක්ෂ පහ දක්වා වන ව්‍යාපෘති සඳහා හඳුන්වා දී ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව සාරාංශ වාර්තාවක් (ඇමුණුම 01) පමණක් ප්‍රමාණවත් වේ. එසේම මුළු ඇස්තමේන්තුව රුපියල් ලක්ෂ පහ හෝ ඊට වැඩි වන සෑම ව්‍යාපෘතියක් සඳහා හඳුන්වා දී ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව ව්‍යාපෘති වාර්තාවක් (ඇමුණුම 02) ඉදිරිපත් කළ යුතුය. තවද, ඊට අමතරව මුළු ඇස්තමේන්තුව මිලියන පහට වඩා වැඩියෙන් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති සඳහා හඳුන්වා දී ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව ශක්‍යතා වාර්තාවක් (ඇමුණුම 03) ඉදිරිපත් කළ යුතුය. මීට වැඩිමනත් වශයෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී, ඕනෑම ව්‍යාපෘතියකට අදාළව තොරතුරු හෝ වාර්තා තවදුරටත් කැඳවිය හැකිය.

III. ව්‍යාපෘති යෝජනා හඳුනාගැනීමේදී, අනුමත කිරීමේදී, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ,ක්‍රියාත්මක කිරීමේදී හා පසු විපරම් කිරීමේදී 2020.07.30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් "බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති" සහ 2020.08.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් "බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ රීති" අනුගමනය කළ යුතුය. මෙයට අමතරව ඒ ඒ මූල්‍ය මූලාශ්‍රයන් සඳහා කාලීනව පවතින චක්‍රලේඛ හා රීති අනුගමනය කළයුතුය.

IV. අමාත්‍යාංශ මගින් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම ව්‍යාපෘති, අමාත්‍යාංශ ලේකම්/ බලය ලත් නිලධාරියකුගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය. එසේම එම ව්‍යාපෘති අනුමැතිය සඳහා යොමු කළ යුත්තේ සත්‍ය වශයෙන්ම සංවර්ධන කාර්යයන්ට සෘජුව සම්බන්ධවන ව්‍යාපෘති බවට තහවුරුකර ගැනීමෙන් පසු, ප්‍රමුඛතාවය අනුව ලේඛන ගතකර, පවතින මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය අනුව අනුක්‍රමිකවය.

V. විවිධ පාර්ශවයන් මගින් සෘජුවම ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා සඳහා ප්‍රධාන ලේකම්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) ගේ නිර්දේශය හා අනුමැතිය ලබා ගත යුතුය.

VI. අමාත්‍යාංශය විසින් සකස් කරන ලද මුළු ඇස්තමේන්තුව රුපියල් මිලියන දහයට වැඩි ව්‍යාපෘති සහ මිලියන දහයට අඩු වුවත් ගැටළු සහිත යම් ව්‍යාපෘතියක් වේ නම් එය සැලසුම් කමිටුවට යොමුකොට නිර්දේශ ලබාගත යුතුය. මෙහිදී සැලසුම් කමිටුවේ සංයුතිය මතු දැක්වෙන නිලධාරීන්ගෙන් සමන්විත වේ. ප්‍රධාන ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් මෙම කමිටුවේ ලේකම්වරයා ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කටයුතු කළ යුතුය. එමෙන්ම මෙහි අනෙකුත් සාමාජිකයින් වන්නේ අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය), නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු), අධ්‍යක්ෂ (සැලසුම්) සහ අධ්‍යක්ෂ (අයවැය) යන නිලධාරීන් වේ.

VII. අදාළ මූල්‍ය සීමාවන්ට යටත්ව ඉදිරි වර්ෂයට අදාළව ව්‍යාපෘතිවල සාරාංශ වාර්තා, ශක්‍යතා අධ්‍යන වාර්තා , ව්‍යාපෘති වාර්තා සහ ඇස්තමේන්තු ආදිය ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය වෙත පවතින වර්ෂයේ ඔක්තෝබර් 31 දින වන විට ලබාදිය යුතුය. එසේම මිලියන දහයට වැඩි ව්‍යාපෘතිවල වාර්තා සම්බන්ධයෙන් පිරික්සුම් ලැයිස්තුවක් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය විසින් නඩත්තු කළ යුතුය. නියමිත කාලය තුළ නොලැබුණු ඉහත ක්‍රමවේදයට අනුගත නොවන ව්‍යාපෘති ප්‍රමාද විය හැකිය. නමුත් සුවිශේෂී හේතුවක් සහිත එනම්, හදිසි සහ ආපදා අවස්ථාවලදී ඉදිරිපත්වන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදිය හැකිය.

VIII. අනතුරුව අදාළ වර්ෂයේ ජනවාරි මස 15 දින වන විට නිසි ක්‍රමවේදයට අනුව ලැබී ඇති ව්‍යාපෘති ප්‍රමුඛතා ගතකොට, පවත්නා ප්‍රතිපාදන සලකා බලා අනුමත කිරීම ආරම්භ කිරීම සිදු කරනු ඇත. පළාත් සංවර්ධන ප්‍රදාන මූල්‍ය මූලාශ්‍රය යටතේ ලැබෙන ව්‍යාපෘති මාර්තු මස 31 දින වන විට අනුමත කිරීම අවසන් කළ යුතු අතර, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මූල්‍ය මූලාශ්‍රය යටතේ ලැබෙන ව්‍යාපෘති ප්‍රතිපාදන ලැබුණු වහාම, අනුමත කිරීම ආරම්භ කර, මැයි මස 31 දින වන විට අනුමත කිරීම අවසන් කළ යුතුය. තවද, සියලුම මූල්‍ය මූලාශ්‍ර යටතේ ක්‍රියාත්මක කරන ලද අදියර ගත නොවන ව්‍යාපෘති සියල්ල නොවැම්බර් 30 දින වන විට, අවසන් කළ යුතු අතර, අදියරගත ව්‍යාපෘතිවල අදාළ අදියර දෙසැම්බර් මස 15 වන විට අවසන් කළ යුතුය. එසේ වුවද සුවිශේෂී හේතුවක් මත මෙම ඡේදයේ සඳහන් දින වකවානු වෙනස් කිරීමේ බලය ප්‍රධාන ලේකම් / සැලසුම් කමිටුවට පැවරේ. එසේම යම් සංරචකයක් යටතේ අනුමත කරන ලද ව්‍යාපෘතියක් පසුව වෙනත් සංරචකයකට සංශෝධනය කළ නොහැකිය. එසේ වුවත් සුවිශේෂ හේතුවක් මත සැලසුම් කමිටුවේ අනුමැතියෙන් පමණක් එවැනි සංශෝධන සිදුකිරීමේ අවස්ථාව ඇත.

IX. ව්‍යාපෘති කළමනාකරණ දත්ත පද්ධතිය(PMS) අදාළ ව්‍යාපෘති බලධාරීන් හා ක්‍රියාත්මක බලධාරීන් විසින් දෛනිකව යාවත්කාලීන කළයුතුය. එසේම අදාළ සියලු බලධාරීන් සමඟ ප්‍රධාන ලේකම්ගේ මූලිකත්වයෙන්ද, ඊට අමතරව අමාත්‍යාංශ මට්ටමින්ද, අවම වශයෙන් මසකට වරක් වත් උක්ත පද්ධතිය උපයෝගී කර ගනිමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විය යුතුය. අමාත්‍යාංශ මට්ටමින් පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අංශයේ මාණ්ඩලික නිලධාරියෙකු සහභාගී කර ගත යුතුය.

X. සියලු මූල්‍ය මූලාශ්‍ර යටතේ ඇති ව්‍යාපෘති ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය මගින් අධීක්ෂණය කළ යුතු අතර, අමාත්‍යාංශ මගින් ද සියලු ව්‍යාපෘති අධීක්ෂණයට ලක්කළ යුතු වේ. එමෙන්ම පසු විපරම් කරනලද ව්‍යාපෘති අතුරින් ගැටළු සහිත ව්‍යාපෘති පිළිබඳ වාර්තා ඒ ඒ අවස්ථාවන්හිදී ප්‍රධාන ලේකම්ගේ අවධානයට යොමුකළ යුතුය. තවද, මුළු ඇස්තමේන්තු මුදල මිලියන දහයට වැඩිවන ඉදිකිරීම්වල ක්‍රියාකාරී අදියරේ මාසික වාර්තා ඉදිරි මාසයේ 10 දිනට පෙර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු විසින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

XI. ඒ ඒ අමාත්‍යාංශ වෙත පැවරී ඇති විෂය පථයන් පිළිබඳ සලකා බලා, ව්‍යාපෘති ද්විකරණය නොවන පරිදි නිශ්චිතව හඳුනාගෙන, අනුමත කිරීමට යොමු කළ යුතුය. එමෙන්ම අදාළ මූල්‍ය හා සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ රීතීන්ට අනුගත වෙමින්, මුළු ඇස්තමේන්තු මුදලට අනුව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම මගින්, ව්‍යාපෘති අනුමත වීමේ ප්‍රමාදයන් සහ නිරතුරුව සිදුවන සංශෝධන වළකාගත හැක.

03. සියලුම ව්‍යාපෘති අනුමත කරණු ලබන්නේ අමාත්‍යාංශයන් වෙත බැවින්, එම සෑම ව්‍යාපෘතියක් සම්බන්ධයෙන්ම අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා වග කිව යුතුය. එසේම සියලුම ව්‍යාපෘති නියමිත පරිදි අවසන් කිරීමටත්, සෑම ව්‍යාපෘතියක් මගින්ම සාර්ථක ඵලදායී නිමවුමක් ළඟා කර ගැනීමට හැකි වන පරිදි සිදු කිරීමටත්, වග බලා ගත යුතුය. එසේම එම ව්‍යාපෘති අවසන් කළ වහාම ප්‍රතිලාභීන්ට නියමිත ප්‍රතිලාභ ලැබෙන පරිදි පවරාදීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

04. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන 2020.10.07 දින සිට ක්‍රියාත්මක කරනු ලබන අතර, මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අදාළ අනෙකුත් නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසද දන්වමි. සෑම වර්ෂයකම ඔබ වෙත ලබාදෙන ප්‍රතිපාදන ඵලදායීව යොදවා ඉලක්ක සපුරාගැනීම ඔබගේ වගකීම වන බවද අවධාරණය කරමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.